**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය-2012**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම

පරිගණක අධ්‍යයන ආයතනය තීක්ෂණ නමින් ඇපයෙන් සීමිත සමාගමක් පිහිටුවා තිබුණු අතර, එහි කළමනාකරණ මණ්ඩලයේ සියයට 80 ක ප්‍රමාණයක් පරිගණක අධ්‍යයන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වන අතර, එම ඇපයෙන් සීමිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඉදිරිපත් කර නොතිබුණි. ඒමෙන්ම මෙම තීක්ෂණ සමාගම සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර පොත් අගය ශූන්‍ය වූ සහ පිරිවැය රු. 2,775,000 ක් වූ භාවිතයේ පවතින වෑන් රථය ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් වෙනත් ආයතන සමග ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති නමයක අතිරික්ත මුදල් රු. 41,336,035 ක් ආදායමට ගැනීම වෙනුවට ජංගම වගකීම් ලෙස වසර කතිපයක සිට ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් ප්‍රතිපත්තිවලට අනුව උපචිත පදනමට ගිණුම් සකස් කර ඇති බව දක්වා ඇතත්, නේවාසිකාගාර කුලී ආදායම මුදල් පදනම මත ගිණුම් ගත කිරීම හේතුවෙන් නේවාසිකාගාර කුලී ආදායම රු.35,933 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) ආයතනය විසින් 2006 මාර්තු 31 දිනැති 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ අංක 37(2)(ආ) වගන්තිය අනුව, ස්ථාවර තැන්පත් පොලියෙන් ඒ ඒ වර්ෂවල අවකරණය කරන ලද එකතුව රු.3,568,155 ක් වූ රඳවා ගැනීමේ බදු මුදල් වියදම් වශයෙන් ගිණුම් ගත කිරීමෙන් තොරව ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු: 471,048 ක් වූ ලැබිය යුතු ශේෂයක් හා එකතුව රු.4,800,790 ක් වූ ගෙවිය යුතු ශේෂ වර්ෂ 1 සිට 8 ක කාල පරාසයකදී නිරවුල්වී නොතිබුණි.

### 1.2.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 394 (අ) | 2010 වර්ෂයේ සිට ජංගම වගකීම් ලෙස දැක්වෙන රු.75,878 ක් වටිනා අවලංගු කළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ xxvi වැනි පරිච්ඡේදයේ 2 උපවගන්තියේ 2.1 | ආයතනයේ පවතින සියලුම ජංගම නොවන වත්කම් වාර්ෂිකව සමීක්ෂණය කළ යුතු වුවත් පිරිවැය රු.465,902,538 ක් වටිනා ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර සමීක්ෂණ මණ්ඩල වාර්තාව 2013 අගෝස්තු 23 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2011 අප්‍රේල් 04 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 4(අ) උපපේදය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2011 ජනවාරි 20 දිනැති අංක 2011/ 01 දරන චක්‍රලේඛය | පර්යේෂණ දීමනාවට හිමිකම් ලබාගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් පර්යේෂණ කළමනාකරණය සඳහා වූ කමිටුව වෙතින් පර්යේෂණ යෝජනාව සඳහා අනුමැතිය ගතයුතු වුවද, ඒ වෙනුවට කළමනාකරණ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය ලබාගෙන තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සමාජිකයන් 25 ක් වෙත සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළදී රු.2,060,529 ක දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) 2002 අංක 01 දරන පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 13 වගන්තියේ 2(1) (ආ) | පර්යේෂණ දීමනාව අඛණ්ඩව ලබාගැනීම සඳහා පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ කමිටුව විසින් සෑහීමකට පත්විය යුතු වුවත් , ආචාර්යවරු 07 දෙනෙක් සඳහා ගෙවූ රු.557,175 ක පර්ක්ෂණ දීමනා සඳහා පර්යේෂණ ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහීමකට පත්වී නොතිබුණි. |
| (ඇ) 2009 ජුනි 03 දිනැති අංක යූජීසී/ජේයූඒ/2/පීජීඑස්/6 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපිය | විශ්ව විද්‍යාල පශ්චාත් උපාධි පාඨමාලා සඳහා දේශන පවත්වන කථිකාචාර්ය වරුන් වෙනුවෙන් පැයකට රු.2,500 ක් බැගින් ගෙවිය යුතු වුවත් 2012 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා දේශන පැයකට රු.3,000 ත් රු.4,000 ත් බැගින් එකතුව රු.2,840,250 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනිමට පෙර රු.5,650,218 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.9,569,010 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රු.91,802,000 ක් ව රජයේ ප්‍රදාන හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.97,452,218 ක් දක්වා වර්ධනය වී ඇත. ඉකුත් වර්ෂයේදී රු.83,102,728 ක් ව පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන හේතුවෙන් ඌණතාවය රු.73,533,724 ක අතිරික්තයක් බවට පත් විය. සමාලෝචිත වර්ෂයේ රු.23,918,500 ක වර්ධනයක් ඇතිවීම සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.8,699,272 කින් වැඩිවීම හා අදායම රු.31,579,250 කින් වර්ධනයවීම බලපා තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිවාස කථිකාචාර්යවරයෙකු 2005 දෙසැම්බර් 31 දින සේවය හැර ගොස් තිබූණු අතර බැදුම්කර වටිනාකම රු 798,589 ක් ආයතනයට අයවීමට තිබුණි. 2006 නොවැම්බර් 16 දින සිට අවස්ථා 03 කදී නීතපතිවරයා විසින් තොරතුරු විමසා ඇතත් එම තොරතුරු නොසැපයීම හේතුවෙන් නීතිමය කටයුතු අඩාල වී තිබුණි. මෙම මුදල් සේවක අර්ථ සාධක අරමුදලන් අයකර ගැනීම සඳහා ද කටයුතු කර නොතිබුණි.

(ආ) කථිකාචාර්යවරයෙකු 2004 ඔක්තෝබර් 01 දින සේවය හැර ගොස් තිබණු අතර අය විය යතු බැළම්කර වටිනාකම රු 1,311,691 ක් විය. 2006 ඔක්තෝබර් 10 දිනැතිව මෙම බැදුම්කර වටිනාකම ගෙවන ලෙස ආචාර්යවරයාට දැනුම් දී ඇතත් පරීක්ෂණ දිනය වන විටත් අදාළ ගෙවීම් සිදු කර නොතිබුණු අතර ආචාර්යවරයාට එරෙහිව නීතිමය පියවර ගැනීමට ආයතනය මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) ආචාර්යවරයෙකු 2004 නොවැම්බර් 01 දින සේවය හැර ගොස් තිබණු අතර අයවිය යුතු බැදුම් කර වටිනාකම රු. 3,440,576 ක් විය. ආචාර්යවරයාගේ වර්තමාන ලිපිනය සොයාගැනීමට නොහැකි වීම හේතුවෙන් නීතිමය පියවර ගැනීම සඳහා 2005 අගෝස්තු 31 නීතිපතිවරයා වෙත යොමු කර ඇතත්, වසර 8 ක් ගතවී තිබණු නමුත් , ආයතනය විසින් නීතිපතිවරයාගෙන් විමසීමක් ද කර නොතිබුණි.

(ඈ) කථිකාචාර්යවරයෙකු 2004 ජනවාරි 01 දින සේවය හැර ගොස් තිබණු අතර අයවිය යුතු බැදුම්කර වටිනාකම රු. 3,373,722 ක් විය. බැදුම්කර කඩ කිරීමෙන් වසර 2 1/2 කට පසුව එනම් 2006 මැයි 22 දින ආයතනයට අයවියයුතු බැදුම්කර මුදල් ගෙවන ලෙස ආචාර්යවරයාට ඇනුම් දී තිබුණද , බැදුම්කර මුදල් අය වී නොතිබුණි. කොළඹ දිසා අධිකරණයේ පවරන ලද නඩුව සමතයකට පත්ව ආචාර්යවරයාගෙන් අයවිය යුතු මුදල 2013 සැප්තැම්බර් 22 දින රු. 2,000,000 ක් හා 2014 මාර්තු 22 දින රු. 1,370,772 ක් ගෙවීමට එකඟ වූ බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා එවා තිබුණි.

3.2 **අරමුදල් ඌන උපයෝජනය**

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා රජය විසින් ජපන් සහයෝගිතා අරමුලවලින් උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (Advance Digital Media Technology Centre) හා ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ ව්‍යාපෘතිය (International Development Research Project) වෙත ලබා දී තිබූ රු: 4,197,538 ක අරමුදල් වසර තුනකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව තබාගෙන තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

රාජ්‍ය ව්‍යාපාර යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2. උපඡේදය ප්‍රකාරව , 2011-2015 කාල පරිච්ඡේදයට පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මේ , ආයතනයේ වත්කම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්, ආයතන සතු ශක්තීන්, පරමාර්ථ හා ඒවා සම්බන්ධයෙන් පවතින දුර්වලතා හා බාධාවන් විශ්ලේෂණාත්මකව හදුනාගැනීම සඳහා සකස්කළ (SWOT Analysis) ප්‍රකාශනයක් හා ආසන්න වර්ෂ තුන සඳහා මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනයක් දක්වා නොතිබුණි.

### 4.2 ක්‍රියාකාර සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාර සැලැස්මේ, ඒ ඒ කාර්යය සඳහා වූ කාල රාමුව, අපේක්ෂිත අරමුණු හා වගකීම දරනු ලබන පුද්ගලයින් වෙනම හදුනාගත හැකිවන පරිදි ඇතුළත් කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් රු.5,500,000 ක ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාකාර සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 4.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

ආයතනයේ 2011 වාර්ෂික වාර්තාව 2013 ජුලි 23 දින වන විටත් සභාගත කර නොතිබුණි. එම වාර්තාව 2013 පෙබරවාරි 14 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් දන්වා තිබුණි.

### 4.4 පරිගණක අධ්‍යයන ආයතන තුළ සීමිත සමාගමක් පිහිටුවීම

පරිගණක අධ්‍යයන ආයතනය පිහිට වූ 2002 අංක 1 දරන කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 18 (iv) වගන්තිය අනුව පරිගණක මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා බලතල පැවරි තිබුණි. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24 වගන්තියට අනුකූල නොවන පරිදි එයට

පරිගණක අධ්‍යයන ආයතනයේ නියමාවලියේ දක්වා ඇති සමාන අරමුණු හා කාර්යයන් ඉටුකිරීම සඳහා පරිගණක සේවා මධ්‍යස්ථානයට සෘජුවම තරඟකාරී ස්වරූපයක් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව කළයුතු වුවත්, කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි සමාගම් ආඥා පනත යටතේ සීමාසහිත තීක්ෂණ පෞද්ගලික සමාගමක් පිහිටුවීම නීතියට අනුකූල නොවන බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂක වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ගිණුම් තැබීම

(ඇ) ව්‍යාපෘති අරමුදල්

(ඈ) මිලදී ගැනීම්